සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

Free download from www.studentlanka.com
Educational Network for students: find courses, degrees, jobs, scholarships. Download past-papers free

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2008 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2008 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2008

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
**Economics II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**සැලකිය යුතුයි :**

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් **දෙකකින්** යුක්ත ය.
- කොටස් දෙකටම කාලය **පැය තුනකි.**
- I හා II කොටස් **එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා** භාර දෙන්න.

විභාග අංකය ..........................

## I කොටස

※ මෙම කොටසේ ප්‍රශ්න 20 ක් ඇත. ඒ සියලු ම ප්‍රශ්න අනිවාර්ය වේ.
※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් ලැබෙන අතර, මුළු කොටසට ලකුණු **40** ක් හිමි වේ.
※ මෙම කොටසට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතුයි.
※ එක් බහුවරණ ප්‍රශ්නයකට ඇත්තේ **එක් නිවැරදි පිළිතුරක්** පමණි. එම පිළිතුර හඳුනාගෙන **පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**1.** රුපියල් 20 000 ක නව තැන්පතුවක් විවෘත කිරීම නිසා, 25% ක ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවක් සහිත වාණිජ බැංකු පද්ධතියකට, මුදල් සැපයුම උපරිම වශයෙන් වැඩි කළ හැක්කේ කෙතරම් ප්‍රමාණයකින් ද?
(i) රුපියල් 20 000 (ii) රුපියල් 25 000 (iii) රුපියල් 60 000
(iv) රුපියල් 65 000 (v) රුපියල් 100 000

**2.** අනිකුත් කරුණු නොවෙනස්ව පවතී නම්, පහත සඳහන් ද අතුරෙන් මුදල් තොගයෙහි අඩුවීමක් ඇති කිරීමට හේතු වන්නේ කවරක් ද?
(i) ගෙවුම් ශේෂයේ අතිරික්තයක්
(ii) බැංකු ණය සඳහා මහජනයා විසින් කරනු ලබන ඉල්ලුමෙහි වැඩිවීමක්
(iii) මහජනතාව තම බැංකු තැන්පතුවලට සාපේක්ෂව ළඟ තබා ගැනීමට කැමැති ව්‍යවහාර මුදල් අනුපාතයෙහි ඉහළ යාමක්
(iv) රාජ්‍ය අංශය විසින් බැංකුවලින් ගනු ලබන ණය ප්‍රමාණයේ වැඩිවීමක්
(v) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි අඩුවීමක්

**3.** මධ්‍යම බැංකුවක් විසින් වෙළෙඳපොළෙහි සුරැකුම්පත් මිල දී ගැනීමක් නිසා මුදල් සැපයුම සහ පොලී අනුපාතික කෙරෙහි කෙබඳු බලපෑමක් සිදුවේ ද?

| | මුදල් සැපයුමට ඇතිවන බලපෑම | පොලී අනුපාතිකයට ඇතිවන බලපෑම |
|---|---|---|
| (i) | වැඩි වේ | වැඩි වේ |
| (ii) | වැඩි වේ | අඩු වේ |
| (iii) | අඩු වේ | වැඩි වේ |
| (iv) | අඩු වේ | අඩු වේ |
| (v) | නොවෙනස්ව පවතී | වැඩි වේ |

**4.** තෝරාගත් ආර්ථික විචල්‍ය කිහිපයක් දර්ශක වශයෙන් පහත සඳහන් වගුවෙහි පෙන්නුම් කෙරේ.

| වර්ෂය | මුදල් තොගය (M) | සංසරණ ප්‍රවේගය (V) | මිල මට්ටම (P) | ගනුදෙනු ප්‍රමාණය (T) |
|---|---|---|---|---|
| 1 වන වර්ෂය | 100 | 100 | 100 | 100 |
| 2 වන වර්ෂය | 120 | 100 | ? | 80 |

දෙවැනි වර්ෂයේ මිල මට්ටම (P) ට අදාළ දර්ශකය කුමක් ද?
(i) 100 (ii) 120 (iii) 150 (iv) 180 (v) 200

[ දෙවැනි පිටුව බලන්න

5. පිරිවැය උද්ධමනයට බලපාන ප්‍රබල සාධකයක් වනුයේ
   (i) අවසාන භාණ්ඩවල මිල වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අමු ද්‍රව්‍යවල මිල ඉහළ යාම ය.
   (ii) අවසාන භාණ්ඩවල මිල වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම වැඩිවීම ය.
   (iii) අවසාන භාණ්ඩවල මිල වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් පරිභෝජන වියදම වැඩිවීම ය.
   (iv) අවසාන භාණ්ඩවල මිල වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අවසාන භාණ්ඩවල සැපයුම වැඩිවීම ය.
   (v) අවසාන භාණ්ඩවල මිල වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුදල් සැපයුම වැඩිවීම ය.

6. තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් ඉන්දියාවට වඩා නිරපේක්ෂ වාසියක් ශ්‍රී ලංකාවට ඇත්නම් ඉන් අදහස් වන්නේ
   (i) ඉන්දියාවට වඩා වැඩියෙන් තේ නිෂ්පාදනය කිරීමට ශ්‍රී ලංකාවට හැකි බව ය.
   (ii) ශ්‍රී ලංකාවට වඩා ඉන්දියාවේ තේ මිල වැඩි බව ය.
   (iii) ඉන්දියාවට වඩා ශ්‍රී ලංකාවේ තේ මිල වැඩි බව යි.
   (iv) ඉන්දියාවට වඩා අඩු සම්පත් ප්‍රමාණයකින් ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය කරනු ලබන බව ය.
   (v) තේ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ඉන්දියාවට වඩා ශ්‍රී ලංකාවේ අඩු බව ය.

7. උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුමේ (NAFTA) සාමාජිකයන් වනුයේ
   (i) කැනඩාව සහ ඇමෙරිකා එක්සත් ජනපදයයි.
   (ii) කැනඩාව, මෙක්සිකෝව සහ ඇමෙරිකා එක්සත් ජනපදයයි.
   (iii) ජපානය හා ඇමෙරිකා එක්සත් ජනපදයයි.
   (iv) යුරෝපා සංගමය, කැනඩාව, මෙක්සිකෝව සහ ඇමෙරිකා එක්සත් ජනපදයයි.
   (v) කැනඩාව, මෙක්සිකෝව, අයිස්ලන්තය සහ ඇමෙරිකා එක්සත් ජනපදයයි.

8. රටවල් අතර ගෝලීයකරණ ක්‍රියාවලිය සීමාකිරීමේ ලා පහත සඳහන් ද අතුරෙන් කවරක් හේතු වේ ද?
   (i) විද්‍යුත් තාක්ෂණයෙහි හටගන්නා දියුණු වීම (ii) නිදහස් වෙළෙඳ ගිවිසුම් සංඛ්‍යාවේ ඉහළයාම
   (iii) සෘජු විදේශ ආයෝජන ප්‍රවාහ ඉහළ යාම (iv) වෙළෙඳ ප්‍රවාහවල පරිමාව ඉහළ යාම
   (v) ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග වැඩිවීම

9. ශ්‍රී ලංකාවේ සමාගමක ව්‍යාපාරික කොටස් ජපානයේ ආයෝජකයින් පිරිසක් විසින් මිලට ගැනීම ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ පෙන්නුම් කරනුයේ
   (i) ප්‍රාග්ධන ගිණුමේ බැර ශේෂයක් වශයෙනි. (ii) ප්‍රාග්ධන ගිණුමේ හර ශේෂයක් වශයෙනි.
   (iii) වර්තන ගිණුමේ බැර ශේෂයක් වශයෙනි. (iv) වර්තන ගිණුමේ හර ශේෂයක් වශයෙනි.
   (v) මූල්‍ය ගිණුමේ බැර ශේෂයක් වශයෙනි.

10. විදේශීය සෘජු ආයෝජන ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ කවර ගිණුමක සටහන් කරනු ලැබේ ද?
   (i) ප්‍රාග්ධන ගිණුම (ii) වර්තන ගිණුම (iii) මූල්‍ය ගිණුම
   (iv) ශුද්ධ ආදායම් ගිණුම (v) ප්‍රාග්ධන සංක්‍රාම ගිණුම

11. වෙළෙඳ අනුපාතය ශ්‍රී ලංකාවට අවාසිදායක වී ඇතැයි ප්‍රකාශ කරනුයේ
   (i) ආනයන පරිමාවට වඩා වැඩි ප්‍රමාණයකින් අපනයන පරිමාව වැඩිවන විට දී ය.
   (ii) අපනයන පරිමාවට වඩා වැඩි ප්‍රමාණයකින් ආනයන පරිමාව වැඩිවන විට දී ය.
   (iii) ආනයන මිලට වඩා වැඩි ප්‍රමාණයකින් අපනයන මිල වැඩිවන විට දී ය
   (iv) අපනයන මිලට වඩා වැඩි ප්‍රමාණයකින් ආනයන මිල වැඩිවන විට දී ය.
   (v) වෙළෙඳාමෙන් ලැබෙන වාසි අවම වන විට දී ය.

12. කිසියම් කල්පිත ආර්ථිකයක විදේශ වෙළෙඳාමට අදාළ දත්ත කිහිපයක් පහත වගුවෙහි දැක්වේ.

| වර්ෂය | අපනයන මිල දර්ශකය | ආනයන මිල දර්ශකය |
|---|---|---|
| 1 | 100 | 105 |
| 2 | 107 | 115 |
| 3 | 116 | 118 |
| 4 | 120 | 125 |
| 5 | 122 | 130 |

සමාන ආනයන පරිමාවක් ලබාගැනීම සඳහා ගෙවීමට සිදුවූ අඩුම අපනයන ප්‍රමාණය වාර්තා වූයේ කවර වර්ෂයේ දී ද?
   (i) 1 වන වර්ෂය (ii) 2 වන වර්ෂය (iii) 3 වන වර්ෂය
   (iv) 4 වන වර්ෂය (v) 5 වන වර්ෂය

13. දෙවසරක කාලයක් තුළ කිසියම් රටක ආර්ථික කාර්ය සාධනය පෙන්නුම් කෙරෙන දර්ශක කිහිපයක් පහත වගුවෙහි දක්වේ.

| වර්ෂය | විනිමය අනුපාතිකය | අපනයන පරිමා දර්ශකය | ආනයන පරිමා දර්ශකය | වෙළෙඳ ශේෂය (රුපියල්) |
|---|---|---|---|---|
| 1 වන වර්ෂය | 100 | 100 | 100 | 0 |
| 2 වන වර්ෂය | 100 | 90 | 100 | + මිලියන 500 |

පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවර ප්‍රකාශයක් ඉහත සඳහන් දත්ත වලට අනුකූල වේද?

(i) අපනයන මිලෙහි පහළ වැටීමක් සිදුවී ඇත.
(ii) වෙළෙඳ අනුපාතයෙහි යහපත් වර්ධනයක් හටගෙන තිබේ.
(iii) ආනයන මිලෙහි වැඩිවීමක් සිදු වී ඇත.
(iv) විනිමය අනුපාතිකයෙහි අගය වැඩිවීම (appreciation) ක් හටගෙන තිබේ.
(v) ප්‍රතිශීර්ෂ මූර්ත ආදයමේ වෙනසක් හටගෙන නොමැත.

14. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යභාරය කුමක් ද?

(i) ගෝලීය වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම
(ii) සාමාජික රටවල් අතර හටගන්නා කාර්මික හා වෙළෙඳ ආරවුල් බේරුම් කිරීම
(iii) දිළිඳු රටවලට ආර්ථික සංවර්ධනය අත්කර ගැනීම සඳහා උපකාර කිරීම
(iv) ගෝලීය මූල්‍ය වෙළෙඳපොළවල මූල්‍ය ස්ථායිතාව පවත්වාගෙන යාම
(v) ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය පවත්වාගෙන යාම සඳහා සාමාජික රටවලට උදව් කිරීම

15. කිසියම් රටක ජාතික ආදයම, ජනගහනයේ ප්‍රමාණය හා සාමාන්‍ය මිල මට්ටම පිළිබිඹු කෙරෙන දර්ශක කිහිපයක් පහත දක්වේ.

| වර්ෂය | නාමික ජාතික ආදයම 1990 = 100 | ජනගහනය 1990 = 100 | සාමාන්‍ය මිල මට්ටම 1990 = 100 |
|---|---|---|---|
| 2000 | 300 | 200 | 100 |
| 2005 | 315 | 220 | 130 |

වර්ෂ 2000 හා 2005 අතර කාලය තුළ මෙම ආර්ථිකය තුළ හටගෙන ඇති වෙනස්කම් වඩාත් නිවැරදිව දක්වෙන්නේ කවර ප්‍රකාශයෙන් ද?


(i) මූර්ත ජාතික ආදයම වැඩිවී ඇත.
(ii) ප්‍රතිශීර්ෂ නාමික ජාතික ආදයම වැඩිවී ඇත.
(iii) ප්‍රතිශීර්ෂ මූර්ත ජාතික ආදයම පහළ වැටී ඇත.
(iv) ජීවන තත්ත්වය උසස් වී ඇත.
(v) ආදයම් වඩාත් සාධාරණ අයුරෙන් බෙදී ගොස් ඇත.

16. "ද්විත්ව ආර්ථිකය" නමැති සංකල්පයෙන් අදහස් කෙරෙනුයේ,

(i) අර්ධ දියුණු ආර්ථික ක්‍රමයක සාම්ප්‍රදායික අංශය හා නවීන අංශය අතර මනා සංකලනයක් දක්නට නොතිබීමයි.
(ii) අර්ධ දියුණු ආර්ථික ක්‍රමයක ධනවත් හා දුප්පත් දෙපිරිස අතර අති විශාල පරතරයක් දක්නට ලැබීමයි.
(iii) පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය හා ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය සඳහා කරනු ලබන ආයෝජන අතර විෂමතාවක් දක්නට ලැබීමයි.
(iv) පරිභෝජනය හා ආයෝජනය අතර පවත්නා නොගැළපීමයි.
(v) අර්ධ දියුණු ආර්ථික ක්‍රමයක පෞද්ගලික අංශය යටපත් කරමින් රාජ්‍ය අංශය බලවත් වීමයි.

17. කිසියම් රටක ආදායම් ව්‍යාප්තිය දක්වෙන ලෝරන්ස් වක්‍රය, එක්තරා කාලපරිච්ඡේදයක් තුළ වෙනස් වී ඇති ආකාරය රූප සටහනෙහි දක්වේ.

ආදායමේ සමුච්චිත ප්‍රතිශතය




ආදායම් උපයන්නන්ගේ සමුච්චිත ප්‍රතිශතය

ලෝරන්ස් වක්‍රය A සිට B දක්වා වෙනස් වීම කෙරෙහි බලපා ඇත්තේ කවර කරුණක් ද?

(i) ගිනි සංගුණකයේ ඉහළ යාමක්
(ii) ධන බද්ද ඉවත් කිරීමක්
(iii) අත්‍යවශ්‍ය භාණ්ඩ මත පනවනු ලබන වක්‍ර බදු ඉහළයාමක්
(iv) අඩු ආදායම්ලාභීන් වෙත දෙනු ලබන සංක්‍රාම වැඩිවීමක්
(v) රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීමක්

18. දෙන ලද අවස්ථාවක එක්තරා ආර්ථිකයක ජනගහනයේ හා ශ්‍රම හමුදාවේ ප්‍රමාණය පහත දක්වේ.

| ජනගහනය (මිලියන) | වැඩ කරන වයසේ ජනගහනය (මිලියන) | සේවා නියුක්ත ප්‍රමාණය (මිලියන) | සේවා වියුක්ත ප්‍රමාණය (මිලියන ) |
|---|---|---|---|
| 30 | 15 | 9 | 3. |

ඉහත දත්තවලට අනුව සහභාගිත්ව අනුපාතිකය හා විරැකියා අනුපාතිකය පිළිවෙළින්

(i) 50% හා 20% වේ.
(ii) 60% හා 25% වේ.
(iii) 60% හා 20% වේ.
(iv) 80% හා 25% වේ.
(v) 50% හා 25% වේ.

19. සාමාන්‍ය වශයෙන් සෑම රටක් ම පාහේ අත්කර ගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රධාන සාර්ව ආර්ථික අභිමතාර්ථ තුනක් වනුයේ

(i) ස්ථාවර මිල ගණන් පවත්වාගැනීම, පොලී අනුපාතික පහත හෙළීම සහ ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් ලබා ගැනීමයි.
(ii) ඉහළ සේවා නියුක්ති මට්ටම් පවත්වාගෙන යාම, මුදල් සැපයුම වැඩි කිරීම සහ ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් ලබාගැනීමයි.
(iii) ස්ථාවර මිල ගණන් පවත්වාගෙන යාම, ඉහළ සේවා නියුක්ති මට්ටමක් පවත්වාගෙන යාම සහ ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් ලබාගැනීමයි.
(iv) ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් ලබා ගැනීම, විරැකියාව අඩු කර ගැනීම සහ පොලී අනුපාතික පහත හෙළීමයි.
(v) ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් ලබා ගැනීම, අඩු උද්ධමන අනුපාතිකයක් පවත්වාගෙන යාම සහ පොලී අනුපාතික පහත හෙළීමයි.

20. කෙටි කාලයේ දී ආර්ථිකය තුළ සංකෝචනාත්මක බලපෑමක් ඇති කිරීමට වඩාත් හැකියාවක් ඇති පිස්කල් (රාජ්‍ය මූල්‍ය) හා මූල්‍ය ප්‍රතිපත්ති සංයෝජනය වනුයේ

(i) අයවැය හිඟය වැඩි කිරීම සහ පොලී අනුපාතික ඉහළ නැංවීමයි.
(ii) අයවැය අතිරික්තය වැඩි කිරීම සහ පොලී අනුපාතික අඩු කිරීමයි.
(iii) අයවැය හිඟය වැඩි කිරීම සහ පොලී අනුපාතික අඩු කිරීමයි.
(iv) අයවැය අතිරික්තය වැඩි කිරීම සහ පොලී අනුපාතික ඉහළ නැංවීමයි.
(v) අයවැය අතිරික්තය අඩු කිරීම සහ පොලී අනුපාතික අඩු කිරීමයි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2008 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2008 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2008

# ආර්ථික විද්‍යාව II
# பொருளியல் II
# Economics II

## II කොටස

**අයදුම්කරුවන්ට උපදෙස් :**

Free download from www.studentlanka.com
Educational Network for students: find courses, degrees, jobs, scholarships.

※ "අ" උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද,
※ "ආ" උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### "අ" උප කොටස
(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

1. (i) පහත සඳහන් ද අතුරෙන් වාණිජ බැංකුවක වත්කම් වශයෙන් ඇතුළත් කරන ද කවරේ ද, වගකීම් වශයෙන් ඇතුළත් කරන ද කවරේ ද යන්න සඳහන් කරන්න.
   (අ) ඉල්ලුම් තැන්පතු
   (ආ) බැංකුවේ කාර්යාල උපකරණ
   (ඉ) මහ බැංකුව වෙතැති තැන්පතු
   (ඊ) ව්‍යාපාරික අංශයට ලබාදුන් ණය
   (උ) ලබාගත් විදේශ ණය
   (ලකුණු 05 යි)

   (ii) වාණිජ බැංකු පද්ධතියක කල්පිත ශේෂ පත්‍රයක් පහත දක්වේ.

| වගකීම් (රුපියල් මිලියන) | | වත්කම් (රුපියල් මිලියන) | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 1 000 | සංචිත | 200 |
| | | ණය | 800 |
| එකතුව | 1 000 | එකතුව | 1 000 |

තවද මෙම ආර්ථිකයේ මහජනතාව සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 1200 ක් වන බවත් බැංකු පද්ධතියෙහි රුපියල් මිලියන 100 ක අධි සංචිත පවතින බවත් සලකන්න.
   (අ) ණය මැවීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වූ විට ආර්ථිකයේ තිබිය හැකි උපරිම මුදල් සැපයුම් ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 03 යි)
   (ආ) මහජනතාව වෙතැති ව්‍යවහාර මුදල් ප්‍රමාණයේ වෙනසක් නොමැතිව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 25% ක් දක්වා ඉහළ නංවනු ලැබුවහොත්, මුදල් සැපයුමේ උපරිම ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02 යි)

   (iii) "2006 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සංචිත මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 42 කින් හෙවත් 21.2% කින් වැඩි වූයේ ය." (මහ බැංකු වාර්ෂික වාර්තාව)
   මෙම වැඩිවීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

2. (i) ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ (financial market) ව්‍යුහය තුළ දක්නට ලැබෙන උප වෙළෙඳපොළ **පහක්** නම් කරන්න. (ලකුණු 05 යි)
   (ii) "ණය ශ්‍රේණිගත කිරීම" (credit rating) යන්නෙන් කුමක් අදහස් වේ ද? මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති විශ්වසනීයත්වය වැඩි කිරීමේ ලා මෙය කොපමණ වැදගත් වේ ද? (ලකුණු 04 යි)
   (iii) "ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික" (policy interest rates) යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? (ලකුණු 02 යි)
   (iv) ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල වෙනස්වීම්, මිල මට්ටම සහ නිමැවුම කෙරෙහි බලපාන ක්‍රියාවලිය විස්තර කරන්න. (ලකුණු 04 යි)

3. (i) 'උද්ධමනය', 'අවධමනය' සහ 'නිරුද්ධමනය' (disinflation) යන යෙදුම් නිර්වචනය කරන්න. (ලකුණු 03 යි)
   (ii) ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටම මිනුම් කිරීම සඳහා භාවිත කෙරෙන දර්ශක **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) සාමාන්‍ය මිල මට්ටම පිළිබඳ මිනුමක් වශයෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ දක්නට ලැබෙන ඌනතා සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iv) උද්ධමනයේ ආර්ථික පිරිවැය මොනවා ද? (ලකුණු 04 යි)